# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 1982 අංක 37 දරන ධීවර (විදේශීය ධීවර බෝට්ටු විධිමත් කිරීමේ) (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1982 ඔක්තෝබර් මස 12 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1982 ඔක්තෝබර් මස 15 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැක

මිළ : ශත 20 යි

තැපැල් ගාස්තුව : ශත 50 යි

## 1982 අංක 37 දරන ධීවර (විදේශීය ධීවර බෝට්ටු විධිමත් කිරීමේ) (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1982 ඔක්තෝබර් මස 12 වන දින]

එල්. ඩී.—ඕ. 62/81.

### 1979 අංක 59 දරන ධීවර (විදේශීය ධීවර බෝට්ටු විධිමත් කිරීමේ) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1982 අංක 37 දරන ධීවර (විදේශීය ධීවර බෝට්ටු විධිමත් කිරීමේ) (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ලුහුඬු නාමය.

2. (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1979 අංක 59 දරන පනතේ යම් විධිවිධානයක කවර වූ තැනක (13 වන වගන්තියේ (5) වන උපවගන්තියෙහි සහ 20 වන වගන්තියෙහි (1) වන උපවගන්තියෙහි හැර) "අධ්‍යක්ෂවරයා" යන වචනය යෙදෙනු ලැබේ ද ඒ වචනය වෙනුවට "ලේකම්වරයා" යන වචනය ආදේශ කිරීමෙන් ප්‍රධාන ප්‍රඥප්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

1979 අංක 59 දරන පනතට පොදු සංශෝධනයක් කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තියෙහි (5) වන උප වගන්තියේ අතුරු වගන්තියේ දැක්වෙන "අධ්‍යක්ෂවරයා හෝ දිසාපතිවරයා" යන යෙදුම වෙනුවට "ලේකම්වරයා හෝ ලේකම්වරයා විසින් තත්කාර්යය සඳහා ලියවිල්ලකින් බලය දෙනු ලැබූ තැනැත්තකු" යන යෙදුම ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය සංශෝධනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තියෙහි (1) වන උප වගන්තියේ "අධ්‍යක්ෂවරයා, නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා හෝ දිසාපතිවරයකු හෝ අතිරේක දිසාපතිවරයකු" යන වචන වෙනුවට "ලේකම්වරයා හෝ ලේකම්වරයා විසින් තත්කාර්යය සඳහා ලියවිල්ලකින් බලය දෙනු ලැබූ තැනැත්තකු" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය සංශෝධනය කිරීම.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) "අධ්‍යක්ෂවරයා" සහ "නියෝජ්‍ය අධ්‍යක්ෂවරයා" යන අර්ථ කථනයන් අත් හැරීමෙන් ; සහ

(2) "අදාළ කටයුතු" යන අර්ථ කථනයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් අර්ථ කථනය ඇතුළත් කිරීමෙන් :—

' "ලේකම්වරයා" යන්නෙන් අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා ලෙස තත් කාලයේ ධුරය දරන තැනැත්තා අදහස් වේ.'.

ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තිය සංශෝධනය කිරීම.

2—ජ 65022 — 11,675 (82/08)

---

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබා ගත හැකිය.